**ජාතික ක්‍රීඩා අරමුදල - 2017**
-----------------------------------

ජාතික ක්‍රීඩා අරමුදලේ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් සහ වියදම් ගිණුම, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 25(4) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර අරමුදලේ වාර්ෂික වාර්තාව සමහ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම
-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම
-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ (3) හා (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ජාතික ක්‍රීඩා අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 පැහැදිලි නොකළ වෙනස්කම්

මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දියගම මහින්ද රාජපක්ෂ ක්‍රීඩා සංකීර්ණයේ ආදායම රු.5,158,385 ක් වූ අතර ක්‍රීඩා සංකීර්ණයේ ව්‍යාපෘති කළමනාකරු විසින් අමාත්‍යාංශය වෙත එවන ලද ආදායම් බැර කිරීමේ විස්තර ඇතුළත් මාසික වාර්තා අනුව ආදායම් එකතුව රු.5,083,640 ක් වුයෙන් රු. 74,745 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

1973 අංක 25 දරන ජාතික ක්‍රීඩා පනතේ 25 (2) වගන්තිය ප්‍රකාර අමාත්‍යාංශයේ ලේකම් විසින් එක් එක් ලිත් වර්ෂය ඉකුත් වූ පසු හැකිතාක් ඉක්මණින් අරමුදලේ පරිපාලනය පිළිබඳ වාර්තාවක් පිළියෙල කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය සඳහා එවැනි වාර්තාවක් පිළියෙල කර නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු.5,824,605 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.60,702,914 ක් වුයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.54,878,309 ක ඌනතාවයේ අඩුවීමක් නිරීක්ෂණය විය. ක්‍රීඩකයින් සඳහා උපහාර උළෙලේ වියදම් රු.71,630,350 කින් අඩු වීම, ආයෝජන මත පොලී රු.3,958,153 කින් වැඩි වීම, දියගම මහින්ද රාජපක්ෂ ක්‍රීඩා සංකීර්ණයෙන් සමාලෝචිත වර්ෂයේදී රු.1,289,478 ක ශුද්ධ ආදායමෙන් ලැබීම සහ ප්‍රදානයන් රු.9,500,000 කින් වැඩි වීම ඉහත ඌනතාවයේ අඩු වීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

ශ්‍රී ලංකාවේ ක්‍රීඩාවලට ධෛර්ය දීම, ඒවා දියුණු කිරීම හා සංවර්ධනය කිරීම අරමුදලේ ප්‍රධාන අරමුණු වූ අතර ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 22 වගන්තියෙන් ඒ සඳහා ක්‍රීඩා අරමුදලට නීතිමය ප්‍රතිපාදන සලසා තිබුණි. 2007 වර්ෂයේ සිට ක්‍රීඩා අමාත්‍යාංශ ලේකම්ගේ පූර්ණ අධීක්ෂණය යටතේ ජාතික ක්‍රීඩා අරමුදල ක්‍රියාත්මක විය. එහෙත් 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 25 (1) වගන්තිය ප්‍රකාරව අරමුදල පරිපාලනය සඳහා අමාත්‍යාංශ ලේකම් විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 4.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

2005/2006 සාක් ක්‍රීඩා උළලේ පිහිනුම් සංචිතයේ පුහුණු කිරීම වෙනුවෙන් යැයි කරුණු දක්වමින් පෞද්ගලික පිහිනුම් පුහුණුකරුවෙකු වෙත ජාතික ක්‍රීඩා අරමුදලින් සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 4 ක් ගෙවා තිබුණද එම ගෙවීමේ නිත්‍යානුකූලභාවය තහවුරු කිරීම සඳහා අමාත්‍යාංශය සහ පුහුණුකරු අතර ඇති කරගත් ගිවිසුම, අදාළ වියදම් වාර්තාව, බිල්පත් ඉන්වොයිස් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ රු.මිලියන 4 ක් ඇතුළුව රු.මිලියන 5.3 ක මුළු වියදමෙන් රු.මිලියන 1.3 ක් 2012 වර්ෂයේදී මේ ආකාරයෙන්ම එම පුහුණුකරු වෙත ගෙවා තිබූ බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

## 5.1 අභ්‍යන්තර විගණනය

ජාතික ක්‍රීඩා අරමුදල සඳහා සමාලෝචිත වර්ෂය තුළදී රු. මිලියන 64 ක ආදායමක් හා අරමුදල් වියදම රු.මිලියන 70 ක් වූ අතර අරමුදල සතුව සමාලෝචිත වර්ෂය අවසාන දිනට පැවති වත්කම්වල එකතුව රු. මිලියන 164 ක් විය. ඒ අනුව මු.රෙ 133 ප්‍රකාරව අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක විය යුතු වූ නමුත් අරමුදල සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණි. ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා තිබුණද ජාතික ක්‍රීඩා අරමුදලේ විගණන කටයුතු එම අභ්‍යන්තර විගණන ඒකකය මඟින් සිදු කිරීමට අවධානය යොමු කර නොතිබුණි.

## 5.2 අයවැය ලේඛනමය පාලනය

අයවැය ගත සංඛ්‍යා හා තථ්‍ය සංඛ්‍යා සැසඳීමේදී විෂයයන් 11 කට අදාළව සියයට 14 සිට සියයට 100 දක්වා විචලනයන් නිරීක්ෂණය වුයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරණයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 06. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අවධානයට වරින්වර යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) අයවැය පාලනය | අයවැය ගත ආදායම් හා වියදම් තත්‍ය ආදායම් හා වියදම් අතර විචලනයන් පැවතීම. |
| (ආ) අභ්‍යන්තර විගණනය | අභ්‍යන්තර විගණනයන් සිදු කර නොතිබීම. |